ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 සැප්තැම්බර් 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සැසඳීමේදී වැය විෂයයන් 06 කට අදාළව විචලතාවය සියයට 87 ක අඩුවීමේ සිට සියයට 286 ක වැඩිවීම දක්වා පරාසයක් තුළ වෙනස් වී තිබුණි.	මූලික වැය ඇස්තමේන්තුව සංශෝධනය කිරීම සඳහා, සියලුම නිලධාරීන් සඳහා රු.5,000 ක මාසික දීමනාවක් සහ විධායක නිලධාරීන් සඳහා රු.25,000 ක දීමනාවක් ගෙවීමට සිදුවීම, ඉල්ලීම් කළ ප්‍රතිපාදන ප්‍රමාණය වෙන්කර නොතිබූ නමුත්, වාහන වල අත්‍යවශ්‍යයෙන්ම සිදුකල යුතු වූ පුනරාවර්තන වර්ගයේ අලුත්වැඩියාවන් කිහිපයක් සිදුකල යුතු වීම, හදිසියේ ඇතිවූ අක්‍රියතා හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ නඩත්තු වියදම් ඉහළයාම, සනීපාරක්ෂක ද්‍රව්‍ය හා අදාළ උපකරණ දෙපාර්තමේන්තුව මඟින් සැපයීමට සිදුවීම, මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ගිවිසුම් ගතවූ රථය සඳහා 2023 වර්ෂයට වඩා ඉහළ අගයක් ගෙවීමට සිදු වීම, බහුකාර්ය ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් හා පරිගණක යන්ත්‍ර 05ක් භාවිතයෙන් ඉවත් කිරීම නිසා සේවා ගිවිසුම් වලට නොඑළඹීම, රැස්වීම්	මු.රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිවත්, තාර්කික ලෙසත් පිළියෙල කළ යුතු වීම.

		සඳහා සංග්‍රහ කිරීමට අදාළ වියදම් දැරීමට සිදුවීම, සම්මාදම් දායක මුදල් ගෙවීමේදී විදේශ විනිමය අනුපාතය අඩුවී තිබීම යනාදි කරුණු හේතු වී තිබුණි.	
(ආ)	අංක 239-1-1-0-2103 දරන මූලධන වැය විෂය සඳහා වෙන් කරන ලද ශුද්ධ ප්‍රතිපාදනය වන රු.4,000,000 ක් සමාලෝචිත වර්ෂය තුළ දී වැය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.	ප්‍රාග්ධන වියදම් සීමා කිරීම මත යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම සීමා කිරීම.	-එම-
(ඇ)	පුනරාවර්තන වැය විෂයයන් 12 ක් සහ මූලධන වැය විෂයයන් 5 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුළ උපයෝජනය කළ පසු රු.615,183,036 ක ඉතිරියක් පැවති අතර, එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 98 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.	ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා, මාණ්ඩලික නිලධාරීන් ඇතුළු නිලධාරීන් කිහිප දෙනෙකු ස්ථාන මාරුවීම හා වැටුප් රහිත දේශීය හා විදේශීය නිවාඩු ලබාගැනීම හේතුවෙන් ඔවුන්ගේ වැටුප් සඳහා වෙන්කල ප්‍රතිපාදන ඉතිරිවීම, ඇස්තමේන්තු කල ප්‍රමාණයට අතිකාල වැඩ වාර්තා නොවීම, බොහෝ රැස්වීම් මාර්ගගත ආකාරයෙන් පැවැත්වීම, දේශීය අරමුදල් භාවිතයෙන් සිදුකරන විදේශීය ගමන් සීමා කිරීම හා ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවට වඩා විනිමය අනුපාතය පහළයාම මත විදේශ ගමන් සඳහා ගෙවිය යුතු ඩොලර් ප්‍රමාණයට අදාළ රුපියල් අගය අඩුවීම, ලිපිද්‍රව්‍ය වල මිළගණන් අඩුවීම. දෙපාර්තමේන්තුවට නව සර්වර් පද්ධතියක් ලබාගැනීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද, රාජ්‍ය ණය කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ හා ඒ සඳහා අවශ්‍ය සර්වර් මෘදුකාංග මිලදී ගැනීමෙන් පසුව, එම කටයුතු සිදු කලයුතු බවට ඉහළ කළමනාකාරීත්වය තීරණය කළ බැවින්, පැවති සර්වර් පද්ධතියම තවත් වර්ෂයක කාලයක් සඳහා දීර්ඝ කිරීම මත වෙන්කල ප්‍රතිපාදන ඉතිරිවීම, සැලසුම් කර තිබූ අනෙකුත් මෘදුකාංග ස්ථාපිත කිරීමද, සර්වර් පද්ධතිය මිලදී ගැනීම මත තීරණය වන බැවින්, එයට අදාළ මෘදුකාංග මිලදී ගැනීමද, නතර කිරීම නිසා ප්‍රතිපාදන ඉතිරිවීම, වත්කම් කළමනාකරණය කරන මෘදුකාංගයේ Trail Version හී පැවති අවශ්‍යතා කිහිපයක් සම්පූර්ණ කරන තෙක්, සේවා ගිවිසුම් වලට එළඹීම වසරකින් කල් දැමීම යනාදිය හා තවත් කරුණු හේතු වී තිබුණි.	-එම-

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව, 2024 දෙසැම්බර් 31 දිනට රු.574,821 ක බැරකම් වලට එළඹ තිබුණද, භාණ්ඩාගාර මුද්‍රිත SA 92 අනුව CIGAS පද්ධතියට ඇතුලත් කර නොතිබුණි.	මහභැරීමකින් සිගාස් පද්ධතියට ඇතුලත් කිරීමට නොහැකි වී ඇත. ඉදිරියේදී අදාළ දත්තයන් ඇතුලත් කිරීමේදී නැවත පරික්ෂාවක් සිදුවන ආකාරයට වැඩ බෙදීම සිදුකර මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු යොදා ඇත.	සියළුම බැරකම් CIGAS පද්ධතියට ඇතුළත් කළ යුතු වීම.
(ආ)	අංක 239-1-1-0-1002 හා 239-1-1-0-1101 දරන වැය විෂයයන් යටතේ වූ කිසිඳු බැරකමක් බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබූ අතර, එම වැය විෂයය යටතේ සමාලෝචිත වර්ෂයට අදාළ පිළිවෙලින් රු.923,943 ක් හා රු.25,200 ක මුදලක් ලෙස එකතුව රු.949,143 ක් 2025 ජනවාරි මාසයේදී ගෙවා තිබුණි.	ඉදිරියේදි නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.	සියළුම බැරකම් මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත කළ යුතු වීම.
(ඇ)	මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්, මු.රෙ. 94(2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශයෙහි මු.රෙ. 94 (2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව ද දක්වා නොතිබුණි.	එළඹිය හැකි උපරිම බැඳීම් සීමා මහභැරීමකින් එහි ඇතුලත් කර නොමැත. ඉදිරියේදී එම දත්තයන් ඇතුලත් කිරීමේදී නැවත පරික්ෂාවක් සිදුවන ආකාරයට වැඩ බෙදීම සිදුකර මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු යොදා ඇත.	සම්පූර්ණ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරමින් පවතින CS-DRMS ණය කළමනාකරණ පද්ධතිය ණය සේවාකරණ පුරෝකතන ඇතුළු කාර්යයන් සඳහා හඳුන්වා දී ඇති පද්ධතියක් බවත්, ඒ	නව ණය කළමනාකරණ දත්ත පද්ධතියක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. ලංසු ලේඛන සකස්කර	මිලදී ගැනීමට යෝජිත නව පද්ධතිය තුළින් මෙම ගැටළුව

අනුව, ණය පිළිබඳ දත්ත ITMIS වෙත මාර්ගගත ක්‍රමයට යොමුකිරීම පිළිබඳව අදාල ආයතන සමඟ සාකච්ඡා සැලකිය යුතු ප්‍රමාණයක් සිදු කලද, තාක්ෂණික ගැටළු හේතුවෙන් දැනට CS-DRMS පද්ධතිය ITMIS සමඟ සම්බන්ධ කිරීම දුෂ්කර කාර්යයක් වී ඇති බවත් විගණනයට දන්වා තිබුණි. ණය කළමනාකරණ කටයුතු සමඟ මුදල් ප්‍රවාහ කළමනාකරණය හා ණය ගණුදෙනු ගිණුම්ගත කිරීමේ පහසුකම් සහිත හා/හෝ CS-DRMS පද්ධතියෙන් ITMIS පද්ධතියට අවශ්‍ය දත්ත හුවමාරු කළ හැකි පහසුකම් සහිත වූ ණය කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීමට දෙපාර්තමේන්තුව 2025 මැයි 20 දින දක්වාත් ක්‍රියාකර නොතිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව, 2024 වර්ෂයට අදාල ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම පහත පරිදි වේ.

සංවර්ධන පාර්ශවකරුවන්	ප්‍රතිලබ්ධි ඇස්තමේන්තු ප්‍රදාන ඇතුලත්ව 2024 (එ.ජ.ඩො මිලියන)	සත්‍ය ප්‍රතිලබ්ධි අගය ප්‍රදාන ඇතුලත්ව 2024 (එ.ජ.ඩො මිලියන)	විචලනය (එ.ජ.ඩො මිලියන)	විචලනය ප්‍රතිලබ්ධි ඇස්තමේන වේ ප්‍රතිශතයඃ ලෙස (%)
ලෝක බැංකුව	397	564.9	167.9	42
ආසියානු සංවර්ධන බැංකුව	600	862.1	262.1	44
චීනය	281	51.9	(229.1)	(82)
ජපානය	59	37.3	(21.7)	(37)
කොරියාව	39	4.3	(34.7)	(89)
මැද පෙරදිග රටවල් සහ ඔපෙක් අරමුදල	83	39.3	(43.7)	(53)
දකුණු ආසියානු රටවල්	124	-	(124)	(100)
රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල්	122	7.94	(114.06)	(93)
IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන	48	16.4	(31.6)	(66)
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	0	334	334	100
	1,753	**1,918**	**165.1**	

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

තාක්ෂණ ඇගයීම් කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

වලක්වා ගැනීමට ක්‍රියා කළ යුතු වීම.

(i)	2024 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම එ.ජ.ඩො මිලියන 1,753 ක් වුවද, සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම එ.ජ.ඩො මිලියන 1,918 ක් වීම හේතුවෙන් සත්‍ය උපලබ්ධි වටිනාකම, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට වඩා එ.ජ.ඩො මිලියන 165.1 කින් එනම් සියයට 9 කින් පමණ වැඩි වී තිබුණි.	සෑම වසරකටම අදාලව ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සකස් කරනු ලබන්නේ පෙර වසරේ දෙවන කාර්තුවේදීය. එය ඇස්තමේන්තු කිරීමේ දී අදාල එක් එක් සංවර්ධන පාර්ශවකරුවන්ට අදාලව ව්‍යාපෘති සඳහා ඉදිරි වසරට අපේක්ෂිත ප්‍රතිලබ්ධීන් පිළිබඳ සලකා බලනු ලැබේ. කෙසේ වෙතත්, වසරට අදාලව සත්‍ය ප්‍රතිලබ්ධීන්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සිදුවන මිල උච්චාවචන මත ව්‍යාපෘති පිරිවැය වෙනස් වීම් හා විනිමය අනුපාත වෙනස් වීම් වැනි හේතු නිසා වෙනස් වේ. එසේ ම විවිධ අවස්ථාවලදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම මත ද සත්‍ය ප්‍රතිලබ්ධි ඇස්තමේන්තු ගත ප්‍රතිලබ්ධි වලට වඩා වෙනස් වේ.	විධිමත් පරිදි සැලසුම් සහගතව විදේශ ණය මූල්‍යනයන් සිදු කළ යුතු වීම.
(ii)	ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව යන පාර්ශවකරුවන්ගෙන් ලබා ගත් ණයවල සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සමඟ සසඳන විට, පිළිවෙලින් සියයට 42 හා 44 කින් වැඩි වී තිබුණි.	ලෝක බැංකුව මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා 2024 වර්ෂයට අපේක්ෂිත ප්‍රතිලබ්ධීන්, 2024 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද අය වැය ඇස්තමේන්තු පාදක කරගෙන සකස් කරන ලදී. එය දළ වශයෙන් ඩොලර් මිලියන 397කි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විස්තීරණ පහසුකමට සමගාමීව ලෝක බැංකුව මගින් අය වැය හිඟය පියවීම සඳහා ආසන්න වශයෙන් ඩොලර් මිලියන 200ක මුදලක් 2024 වර්ෂයේ ලබා දෙන ලදී. එය පුරෝකථනය සඳහා ඇතුලත් කර නොමැත. එසේම, ආසියානු සංවර්ධන බැංකු සහනදායි මූල්‍ය සම්පත් පැකේජයේ තවදුරටත් ලබා දිය හැකි ප්‍රතිපාදන පැවතීම මත හා ශ්‍රී ලංකාව ද අයවැය සහායක ප්‍රතිපාදන අවශ්‍යතාවය පැවති නිසා අයවැය සහායක	-එම-

		ප්‍රතිපාදන ලබා ගෙන ඇත.	
(iii)	චීනය, ජපානය, කොරියාව, මැද පෙරදිග රටවල්, IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන හා රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් වලින් ලබා ගැනීමට අපේක්ෂා කල ණය පිළිවෙලින් සියයට 82, 37, 89, 53, 66 සහ 93 කින් අඩු වී තිබුණි.	ශ්‍රී ලංකා රජය විසින් ණය වාරික ගෙවීම තාවකාලිකව අත්හිටුවීම වීම නිසා චීනය, ජපානය, කොරියාව, රුසියාව හා ඕස්ට්‍රේලියාව යන රටවල් ණය ප්‍රතිලබ්ධීන් නවතනු ලැබූ අතර, ඇස්තමේන්තු සැකසීමේ දී, 2024 වසර තුල නැවත ප්‍රතිලබ්ධීන් ආරම්භ කරනු ඇතැයි වන උපකල්පනය මත පිහිටා ඇස්තමේන්තු කර ඇත.	-එම-
(iv)	සමාලෝචිත වර්ෂයේ දී දකුණු ආසියානු රටවල්වලින් ණය ලබා ගැනීමට ඇස්තමේන්තු කලද, වර්ෂය අවසාන වන විටත් ණය ලබා ගෙන නොතිබුණි.	2024 වසරේ පැවති ආර්ථික පසුබිම හා රජයේ මූල්‍ය ප්‍රතිපත්ති මත හා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන්ව නොමැති නිසා ණය ලබා ගැනීමක් සිදුවී නොමැත.	-එම-
(v)	සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් (IMF) කිසිදු ප්‍රතිලබ්ධිවීමක් අපේක්ෂා නොකළද එ.ජ.ඩො.මිලියන 334 ක් ප්‍රතිලබ්ධි වී තිබුණි.	ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ලබා ගැනීම්, මුදල් අමාත්‍යාංශය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති එකඟතාව මත තිරණය වනු ඇත. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන සංවර්ධන ව්‍යාපෘති සඳහා වන ප්‍රතිලබ්ධීන් ඇස්තමේන්තු කිරීමේ දී එම අගයන් ඇතුලත් කර නැත.	ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එළඹ ඇති විස්තීරණ ණය පහසුකම් අනුව ලැබිය හැකි මුදල් පුරෝකථනය කළ හැකි වීම.
(ඇ)	රජයේ මූල්‍ය ප්‍රකාශන වල පැහැදිලි කිරීමේ සටහන් 02 (Explanatory Notes) යටතේ 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශීය ණය වටිනාකම රු.මිලියන 1,070 ලෙස දක්වා තිබුණද, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඒවායේ ප්‍රතිලබ්ධි කාලයන් හි පහත වෙනස්කම් නිරීක්ෂණය විය.	විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ.	රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම.

ණය අංකය	මූල්‍ය ප්‍රකාශනය අනුව ප්‍රතිලබ්ධි වූ කාලය	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු වේ තොරතුරු අනුව ප්‍රතිලබ්ධි වූ කාලය

2012017	2020 දෙසැම්බර්	2024
2012025	2023 නොවැම්බර්	2024
2016035	2022 සැප්තැම්බර්	2022 සැප්තැම්බර් 2023 මාර්තු සහ සැප්තැම්බර්

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2020 සිට 2023 වර්ෂය දක්වා විගණනය වෙත ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව, ඉහත දක්වා ඇති ණය ප්‍රතිලබ්ධි වී තිබූ බව දක්වා නොතිබුණි. එකම ණය ගනුදෙනුවලට අදාළව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එකිනෙකට පරස්පර තොරතුරු විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඒ අනුව, අදාළ වගකීම් පැවැරූ දෙපාර්තමේන්තු විසින් විදේශ ණය ප්‍රතිලබ්ධිවීම පිළිබඳව විධිමත් හා යාවත්කාලීන තොරතුරු පවත්වාගෙන නොමැති බව අනාවරණය විය. තවද, විදේශීය ණය වාර්තා කරනු ලබන පද්ධතියේ Stock and Flow Report No.1 වාර්තාව අනුවද, ඉහත ණය පිළිබඳව විධිමත් හා යාවත්කාලීන තොරතුරු පවත්වා ගෙන නොතිබුණි. ඒ අනුව, ඉහත විදේශීය ණය ගණුදෙනුවලට අමතරව විධිමත් ලෙස වාර්තා නොවූ වෙනත් විදේශීය ණය පැවතීමේ ඉහළ අවධානමක් පැවතිය හැකි බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශීය ණය කළඹ පවත්වාගෙන යාම හා ඒවා විධිමත්ව කළමනාකරණය කිරීමෙහිලා අවශ්‍ය වන මූලික දත්ත පද්ධතිය පවත්වාගෙන යාම දෙපාර්තමේන්තුවේ මූලිකම කාර්යභාරයක් වේ. ඒ සඳහා CS-DRMS ණය කළමනාකරණ පද්ධතිය භාවිතා කරනු ලැබේ. එසේවුවද, දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තොරතුරු පද්ධතිය මඟින් සම්පූර්ණ වූත්, යාවත්කාලීනවූත් තොරතුරු නොපවතින අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව:

(i) ඉහත පද්ධතියෙන් ලබාගත් Stock and Flow Report No.1 වාර්තාව අනුව, ණය ගිවිසුම් 18 කට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් අතර ශුද්ධ එකතුව රු.මිලියන 3,711 ක වෙනස්කම් නිරීක්ෂණය විය.	ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ විමසා බැලීමේදී අනාවරණය වූ පෙර වර්ෂවල සිදුවූ ගනුදෙනු සමාලෝචිත වර්ෂයේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුවීම, අත්වැරදීමකින් විනිමයන් වැඩි අගයන් සටහන්වීමේ වරද නිවැරදි කිරීම් හා ප්‍රමාද වී ලද ප්‍රතිලබ්ධි වටිනාකම් සටහන් කිරීම වැනි කරුණු හේතු වී තිබුණි.	රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය වාර්තා කිරීම හා ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම.

(ii) පසුගිය වර්ෂයේ සිදුවූ විදේශීය ණය ප්‍රතිලබ්ධිවීම් සමාලෝචිත වර්ෂයේදී සිදුවූ බවට පද්ධතියේ සටහන් කිරීම හේතුවෙන් රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිලබ්ධිවීම් අතර පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

-එම-

-එම-

ණය අංකය	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව	තොරතුරු පද්ධතිය අනුව ප්‍රතිලබ්ධිවීම්	වෙනස
2012024	USD 947,057	USD 709,147	USD 237,910
2019019	USD 28,717,515	USD 24,938,700	USD 3,778,815
2019043	SAR 47,320,932	SAR 47,284,890	SAR 36,042
2015021	EUR 28,227	නැත	EUR 28,227
2012025	SAR 570,876	SAR 272,171	SAR 298,705

(iii) විදේශීය ණය ප්‍රදායකයන්ගේ වාර්තා සහ තොරතුරු පද්ධතියේ වාර්තා අතර සැලකිය යුතු වෙනස්කම් පැවතින බව නිරීක්ෂණය විය. උදාහරණ ලෙස ප්‍රදායකයන්ගේ ණය ශේෂ තහවුරුකිරීම් හා පද්ධතියේ වාර්තා වූ ණය ශේෂයන් අතර වෙනස්කම් හේතුවෙන් ණය අංක 1990009 අදාළව SDR 2,064 ක් හෙවත් රු.787,553 ක් වැඩියෙන් ද ණය අංක 20240001ට අදාළව SDR 230,057 හෙවත් රු.මිලියන 87 ක් අඩුවෙන්ද රජයේ මූල්‍ය ප්‍රකාශන වාර්තා කර තිබුණි.

විවිධ විනිමයෙන් සටහන් කර ඇති තොරතුරු මෙම ණයෙහි මූර්ත විනිමය (Denominated Currency)ට පද්ධතිය විසින් පරිවර්තනය කිරීමේ දී ඇති වී ඇති විනිමය වෙනස හේතුවෙන් අදාළ විෂමතාවය ඇති වී ඇත. එම විෂමතාව මේ වන විට නිවැරදි කර ඇත.

තවද, 2024.12.31 දිනට අදාළව 2025.01.31 දින සැකසූ Stock and Flow Report වාර්තාවේ 2024.12.20 දිනට අදාළව සිදුවූ ආපසු ලබා දීමක් (Refund) පද්ධතියේ නිවැරදිව යාවත්කාලීන කර ඇත. නමුත්, අදාල ණයහිමියා විසින් 2024.12.31ට අදාලව එවන ලද ශේෂයන්හි එම ආපසු ලබාදීම (Refund) එම ශේෂ ලබාගන්නා අවස්ථාවේ යාවත්කාලීන කර නොමැති බව පෙනී යයි.

-එම-

(ඇ)	1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශාධාර සම්බන්ධ සියළු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කළ යුතු බව සඳහන් වුවද, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 08 ක එකතුව රු.මිලියන 1,047.6 ක විදේශ ප්‍රදාන සෘජුව ලැබී තිබුණි. ඒ අනුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ දැනුවත්භාවයකින් තොරව විවිධ පාර්ශව වෙත විදේශ ප්‍රදාන සෘජුව ලබාගැනීමේ අවස්ථාව පවතින බවත් එම හේතුවෙන්, විදේශාධාර සම්බන්ධ ජාතික වශයෙන් පිළියල කරනු ලබන තොරතුරුවල නිවැරැදිතාවය හා සම්පූර්ණත්වය පිළිබඳ ගැටළු පැන නැගීම, නිසි නියාමනයකින් තොරව විදේශ ප්‍රදාන ලබා ගැනීමේ හා උපයෝජනය කිරීමේ අවධානමක් පැවතීම, රජයේ මූල්‍ය ප්‍රකාශවල නිවැරදි නොවන තොරතුරු අන්තර්ගතවීම, නිවැරදි නොවන තොරතුරු පදනම්ව රජයේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ අවධානමක් ඇතිවීම වැනි අහිතකර තත්ත්වයන් ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය.	1994.04.20 දිනැති අංක 30/94 දරණ චක්‍රලේඛය මෙන්ම විවිධ චක්‍රලේඛ හා උපදෙස් මඟින් ද පෙන්වා දී ඇති පරිදි නිසි ක්‍රමවේදය අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත්ව ලබාගන්නා ප්‍රදාන පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ පරිදි සටහන් කිරීම සිදුකරනු ලබයි. වෙනත් ආයතන වෙත පමණක් වාර්තා වූ ප්‍රදාන සම්බන්ධයෙන් එම චක්‍රලේඛ, උපදෙස් මාලාවන් හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානින්ගේ වගකීමක් වේ.	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම හා අදාළ ආයතන ඒ පිළිබඳව නිරන්තරව දැනුවත් කර පසු විපරම් කළ යුතුවීම.
(ඉ)	2019 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා විදේශ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් විදේශ ප්‍රදානිත ව්‍යාපෘති 03 ක් සමඟ එකතු වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 18 ක්, රු. මිලියන 290 ක් හා කොරියන් වොන් බිලියන 14.3 ක් වූ ගිවිසුම්වලට එළඹ තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඊට අදාළ විදේශ ප්‍රදාන ලද බවට විගණනයට තහවුරු නොවුණි.	මෙම ව්‍යාපෘති 03 සඳහා ප්‍රදානයන් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණි.	ශ්‍රී ලංකා රජය විසින් ගිවිසුම් වලට එළඹෙන විදේශ ප්‍රදානයන් සම්පූර්ණ වශයෙන් ලබාගෙන, උපරිම වශයෙන් අරමුණට යොදවා ගැනීමට කටයුතු කළ යුතු වීම.

4.3 විදේශීය ණය ලබා ගැනීමේදී ශ්‍රී ලංකා රජය විසින් ස්වාධිපත්‍යයේ මුක්තිය අත්හැරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජය සතුව පැවති ව්‍යාපෘති ණය 755 න් ව්‍යාපෘති ණය 549 කට අදාළව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු අනුව, විදේශීය ව්‍යාපෘති ණය 78 කට අදාළ ණය ගිවිසුම්වල ස්වාධිපත්‍යයේ මුක්තිය විවිධ අයුරින් අත්හැරීමේ (Waiver of Sovereign	මෙම ණය ගිවිසුම්වලට එළඹීමට පෙර මහ බැංකු මුදල් මණ්ඩලයේ, අමාත්‍ය මණ්ඩලයේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ඇත. තවද, චීන රජය සහ ණය ප්‍රදානිත චීන මූල්‍ය ආයතන සමග ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා අවසන් වී නොමැති හෙයින්, ශ්‍රී ලංකා රජය මුහුණ පා ඇති අවදානම සම්බන්ධයෙන් මේ	ඉදිරියේ දී විදේශීය ණය ලබා ගැනීමේ දී අදාළ ණය ගිවිසුම් වල ඇතුලත් ස්වාධිපත්‍යයේ මුක්තිය අත්හැරීම පිළිබඳ ඡේදයන් සම්බන්ධව විශේෂ

Immunity) ඡේදයන් අන්තර්ගත කර තිබූ බව නිරීක්ෂණය විය.	අවස්ථාවේදී තීරණය කළ නොහැක. ශ්‍රී ලංකා රජය විසින් ද්වි පාර්ශවීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේදී තම මූල්‍ය සහ නීති උපදේශකවරුන් ලෙස Clifford Chance LLP සහ Lazard Inc. යන ජාත්‍යන්තර උපදේශකවරුන් පත් කර ඇති අතර එම උපදේශකවරුන්ගේ නිසි උපදෙස් අනුව ශ්‍රී ලංකා රජය අදාළ ණය ගිවිසුම්වල සඳහන් ස්වාධිපත්‍යයේ මුක්තිය අත්හැරීමේ වගන්තිවලටද අනුකූලව චීන රජය සහ ණය ප්‍රදානිත චීන මූල්‍ය ආයතන සමඟ තවදුරටත් ණය ප්‍රතිව්‍යුහගතකරණ සාකච්ඡා පවත්වා ගෙන යනු ලබයි.	අවධානය යොමු කළ යුතු වීම.

4.4 විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) විදේශීය සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, චීනයේ අපනයන ආනයන බැංකුවෙන් ලබාගත් ණය වර්ග 52 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට යොමු කර තිබුණි. ඒ තුළ රජයේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26 (ii) දැක්වෙන ව්‍යාපෘති ණය 48 ක්ද, සටහන් අංක 26 (iii) න් දැක්වෙන විදේශීය මුදල් කාලීන ණය පහසුකම් 04 ක් ද අන්තර්ගත වී තිබුණි. විස්තර පහත පරිදි වේ.		
(i) ව්‍යාපෘති 44 කට අදාළව විදේශ ව්‍යවහාර මුදලින් ගණනය කරන ලද නොගෙවූ ණය පොළිය සහ දඩ පොළිය, 2024 ජනවාරි 01 දිනට පැවති ණය ශේෂයට එකතු කර ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ණය ශේෂය ගණනය කර පසුව ණය කල්පිරෙන කාලය දීර්ඝ කර ණය පොළී අනුපාතය ද අඩු කර තිබුණි. ඒ අනුව, ව්‍යාපෘති 33 කට අදාළව ණය ශේෂ ඇමරිකානු ඩොලර් මිලියන 236 කින් ද, ව්‍යාපෘති 11 කට අදාළව ණය ශේෂ රෙන්මින්බි (යුආන්) මිලියන 275 කින් ද වැඩි වී තිබුණි.	මෙම වෙනස්වීම්, අදාළ එක් එක් ණය ප්‍රතිව්‍යුහගතකරණයට පෙර හා ඉන්පසු ඇති වූ වෙනස්කම් වේ. ඒ අනුව, විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.

	(ii) විදේශීය මුදල් කාලීන ණය පහසුකම් 04 කට අදාළව ගණනය කරන ලද නොගෙවූ ණය පොළිය සහ දඩ පොළිය 2024 ජනවාරි 01 දිනට පැවති ණය ශේෂයට එකතු කර ප්‍රතිව්‍යුහගතකරණ ලද ණය ශේෂය ගණනය කර, පසුව කල්පිරෙන කාලය දීර්ඝ කර ණය පොළී අනුපාතය ද අඩු කර තිබුණි. ඒ අනුව ණය පහසුකම් 03 කට අදාළව ණය ශේෂ ඇමෙරිකානු ඩොලර් මිලියන 258 කින් ද, එක් ණය පහසුකමකට අදාළව ණය ශේෂය රෙන්මින්බී (යුආන්) මිලියන 180 කින් ද ඉහළ ගොස් තිබුණි.	-එම-	තොරතුරු ඉදිරිපත් කිරීමකි.
	(iii) 2024 ජනවාරි 01 දිනට පැවති යුරෝ මිලියන 4.5 ක ණය ශේෂයට හිඟ හිටි ණය පොළිය හා දඩ පොළිය ලෙස යුරෝ 573,924 ක් එකතු කර එයින් යුරෝ මිලියන 2.4 ක් හෙවත් සියයට 48 ක් ණය හිමියන් විසින් අත්හැරීමෙන් (Hair cut) අනතුරුව ඉතිරි යුරෝ මිලියන 2.6 ක ශේෂය, 2024 වර්ෂය තුළදී ගෙවා නිම කර තිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.
	(iv) ව්‍යාපෘති 03 කට අදාළව රෙන්මින්බී (යුආන්) මිලියන 40 ක ණය ශේෂය කිසිදු ප්‍රතිව්‍යුහගතකරණය කිරීමකින් තොරව 2024 වර්ෂය තුළ ගෙවා නිම කර තිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.
(ආ)	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 (iv) හි දක්වා ඇති 2024 ජනවාරි 01 දිනට පැවති ඇමරිකානු ඩොලර් මිලියන 12,550 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ණය 11 ක් 2024 වර්ෂය තුළ දී ප්‍රතිව්‍යුහගතකරණය කර තිබුණි. ඒ අනුව, එම බැඳුම්කර 11 හි කල් පිරෙන කාලය දීර්ඝ කර ණය හිමියා විසින් නාමිකව ණය අත් හැරීමක් (Nominal Hair cut) සිදු කර තිබූ අතර අවම සාමාන්‍ය පොළී අනුපාතයක් නියම කර නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර 08 ක් බවට පරිවර්තනය කර ඇති බව දක්වා තිබුණි. තවද, මෙම බැඳුම්කරවලට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ණය පොළිය ඇමෙරිකානු ඩොලර් මිලියන 3,750 ක් වූ අතර ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර 08 හි වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 10,647 ක් වී තිබුණි.	මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2024.12.18 දිනැති මාධ්‍ය නිවේදන මඟින් මෙම තොරතුරු ලබාගත හැකිය.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 16 ක් ද, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 11 ක් ද ඇතුළුව මුළු පුරප්පාඩු 35 ක් පැවතුණි. තවද, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 07 දෙනෙකු හා ද්විතීයික මට්ටමේ නිලධාරීන් 04 දෙනෙකු 2022 ජුනි 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 ප්‍රකාරව දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබුණි. එසේ වුවද, කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර පවතින පුරප්පාඩු පිරවීමට හෝ අනවශ්‍ය තනතුරු යටපත් කිරීමට හෝ සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ විෂය පථයේ කොටසක් ණය කළමනාකරණ කාර්යාලය වෙත පැවරීමට නියමිතව පැවති බැවින්, එම කටයුතු අවසන් කළ පසු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සමාලෝචනයක් සිදුකර පුරප්පාඩු සම්පූර්ණ කළයුතුව පැවති බැවින්, එම පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත නොකරන ලදි.	අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම හා අත්‍යවශ්‍ය නොවන පිරිස් කාර්ය මණ්ඩලය තුල වේ නම් අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කළ යුතු වීම.